© සියලු ම හිමිකම් ඇවිරිණි

අනු අංකය: ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ සංගමය

## ශිල්පීය අදියර
## 2009 මාර්තු විභාගය

විභාග දිනය : 2009 මාර්තු 28 | පිටු ගණන : 06
විභාග වේලාව : පෙ.ව. 9.30 - ප.ව. 12.30 | ප්‍රශ්න ගණන : 05

අයදුම්කරුවන්ට උපදෙස්:
1. නියමිත කාලය පැය 3 කි.
2. සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න.
3. පිළිතුරු සැපයිය යුත්තේ සිංහල භාෂාවෙන් පමණි.

| විෂය | විෂය සංකේතය |
|---|---|
| මූලික කළමනාකරණ ගණකාධිකරණය | (MAF / 502) |

---

**ප්‍රශ්න අංක 01** *(ලකුණු 20)*

අංක 01 දරණ ප්‍රශ්නයේ සියලුම කොටස්වලට උත්තර සපයන්න. එක් එක් ප්‍රශ්නයට වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. එසේ තෝරාගත් උත්තරයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ප්‍රශ්න අංකය සමඟ පිළිතුරු පොතේ ලියන්න. උදා: **(1) (a), (2) (b)** වශයෙන්.

(1) පිරිවැය ගිණුම්කරණය කළමනාකරණ ගිණුම්කරණයෙන් වෙනස් වන්නේ:
- (a) ආයතනයෙන් බාහිර කණ්ඩායම්වලට පමණක් තොරතුරු සපයන නිසා ය.
- (b) අභ්‍යන්තරව ලාභය මැනීමට හා බාහිර වාර්තාකරණයට පිරිවැය තොරතුරු පමණක් සපයන නිසා ය.
- (c) අභ්‍යන්තර වාර්තාකරණයට පමණක් පිරිවැය තොරතුරු සපයන නිසා ය.
- (d) මූල්‍ය ගිණුම්කරණයේ එක් ශාඛාවකි.

පහත සඳහන් තොරතුරු ප්‍රශ්න අංක (2) හා (3) සඳහා අදාළ වේ.

ජනප්‍රිය පාවහන් සැපයුම්කරුවෙකු සම්බන්ධව පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කොට ඇත.

| | | |
|---|---|---|
| සාමාන්‍ය පාවිච්චිය දිනකට | - | පාවහන් කුට්ටම් 140 |
| අවම පාවිච්චිය දිනකට | - | පාවහන් කුට්ටම් 90 |
| උපරිම පාවිච්චිය දිනකට | - | පාවහන් කුට්ටම් 175 |
| යළි ඇණවුම් කාලය (Lead Time) | - | දින 10 සිට 16 |
| යළි ඇණවුම් ප්‍රමාණය | - | පාවහන් කුට්ටම් 3,000 |

(2) තොග ප්‍රතිෂ්ඨාපනයට යළි ඇණවුමක් නිකුත් කළ යුත්තේ තොග කුමන මට්ටමකට ආ විට ද?
- (a) 2,240
- (b) 2,800
- (c) 3,000
- (d) 5,740

(3) තබාගත හැකි උපරිම තොග මට්ටම කවරේ ද?

(a) 2,800
(b) 3,000
(c) 4,900
(d) 5,800

(4) පිරිවැය වර්ගීකරණයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ:

(a) පිරිවැය හැසිරෙන ආකාරය අධ්‍යයනය කිරීමට
(b) පිරිවැය පාලනයට
(c) විවිධ පිරිවැය සංකල්ප අවබෝධ කරගැනීමට
(d) පාලනය හා තීරණ ගැනීමට අවශ්‍ය පිරිවැය තොරතුරු සැපයීමට

(5) පිරිවැය පාලනයට හා තීරණ ගැනීමට සුදුසු පිරිවැය වර්ගීකරණය වන්නේ:

(a) ස්ථාවර හා විචල්‍ය පිරිවැය
(b) අදාළ හා අදාළ නොවන පිරිවැය
(c) කාලච්ඡේද හා භාණ්ඩ පිරිවැය
(d) ඍජු හා වක්‍ර පිරිවැය

(6) නිෂ්පාදන පිරිවැයට අදාළ සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(a) සියලුම විචල්‍ය පිරිවැය ඍජු පිරිවැයයි.
(b) සියලුම ඍජු පිරිවැය විචල්‍යයි.
(c) සියලුම නිෂ්පාදන පිරිවැය විචල්‍ය පිරිවැයයි.
(d) සියලුම පිරිවැය දිගුකාලීනව පාලනය කළ නොහැක.

(7) සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(a) ඕනෑම ක්‍රියාකාරී මට්ටමක ඍජු පිරිවැය නියත වේ.
(b) වර්තමාන ක්‍රියාකාරී මට්ටමේ දී ඍජු පිරිවැය නියත වේ.
(c) ඍජු පිරිවැය දිගුකාලයේ දී පමණක් නියත වේ.
(d) ඕනෑම වර්තමාන ක්‍රියාකාරී මට්ටමක දී ස්ථාවර පිරිවැය නියත වේ.

(8) පහත සඳහන් වාකශ කියවන්න.

A. සෑම සංවිධානයකටම ගැණුම් දෙපාර්තමේන්තුවක් ඇතිකිරීම වැදගත් වේ.
B. මධ්‍යගත එරෙහිව විමධ්‍යගත ගැණුම් දෙපාර්තමේන්තුවක් ඇති කිරීම පරිපාලනයේ තීරණයකි.
C. ඇණවුමක් කිරීමෙන් පසුව පාවිච්චිය සාමාන්‍ය මට්ටමට වඩා ඉහළ ගිය විට හෝ පොරොත්තු කාලය (Lead Time) අපේක්ෂිත කාලයට වඩා වැඩි වුවහොත් හෝ තොග අවම මට්ටමකට වැටේ.

(a) B හා C පමණක් සත්‍ය වේ.
(b) A හා B පමණක් සත්‍ය වේ.
(c) A හා C පමණක් සත්‍ය වේ.
(d) ඉහත සියලුම සාධක සත්‍ය වේ.

(9) ඍජු වැටුප්වල අඩංගු අතිකාල දීමනාව සාමාන්‍යයෙන් වර්ග කළ හැක්කේ:

(a) වක්‍ර ශ්‍රම පිරිවැය
(b) කම්හල් පොදුකාර්ය පිරිවැය
(c) ඍජු ශ්‍රම පිරිවැය
(d) පරිපාලන පොදුකාර්ය පිරිවැය

(10) සම්මත කාලය පැය 60 කි. පැයකට අනුමත ගෙවීම රු. 50/- කි. පැය 48 ක් ඇතුළත නිම කරන ලද කාර්යයකට ගෙවිය යුතු වැටුප කොපමණ ද? රෝවන් සැලැස්ම සැළකිල්ලට ගන්න.

(a) රු. 2,400

(b) රු. 2,680

(c) රු. 2,880

(d) රු. 3,000

**(10 x 02 = මුළු ලකුණු 20)**

**<u>ප්‍රශ්න අංක 02</u>** *(ලකුණු 20)*

සීමිත 'ගුඩ් ලක්' සමාගමේ 2008 පෙබරවාරි මස ආරම්භයේ පිරිවැය ලෙජරයේ ආරම්භක ශේෂ පහත දක්වේ.

| | රු. |
|---|---|
| ගබඩා පාලන ලෙජර් ගිණුම | 364,000 |
| නොනිමි වැඩ පාලන ගිණුම | 230,000 |
| නිමි භාණ්ඩ පාලන ගිණුම | 157,000 |
| පොදු ලෙජර් පාලන ගිණුම | 751,000 |

2008 පෙබරවාරි මාසය තුළ දී පහත සඳහන් ගනුදෙනු සිදු විය.

| | රු. | රු. |
|---|---|---|
| ද්‍රව්‍ය මිලට ගැනුම් | | 287,500 |
| ද්‍රව්‍ය නිකුත් කිරීම්: | | |
| නිෂ්පාදන දෙපාර්තමේන්තුවට | 213,000 | |
| සේවා දෙපාර්තමේන්තුවට | 42,000 | |
| නිෂ්පාදන උපකරණ | 56,000 | |
| | | 311,000 |
| ගෙවූ දළ කර්මාන්තශාලා වැටුප්: | | |
| ඍජු වැටුප් | 328,000 | |
| වක්‍ර වැටුප් | 195,000 | |
| නිෂ්පාදන උපකරණ නිපදවීමට වැය වූ වැටුප් | 60,000 | |
| | | 589,000 |
| නිෂ්පාදන උපකරණ නිපදවීමේ දී වැය වූ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | | 36,300 |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය (නිෂ්පාදන උපකරණ නිපදවීමේ පිරිවැය හැර) | | 19,700 |
| 2008 පෙබරවාරි මාසයේ ඌණ අන්තර්ග්‍රහණ නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | | 40,000 |
| හානි වී ලියා හල අමුද්‍රව්‍ය තොග | | 12,000 |
| විකුණුම් පිරිවැයට අන්තර්ගත කළ විකුණුම් පොදුකාර්ය පිරිවැය | | 105,000 |
| විකුණුම් | | 880,000 |

සමාගමේ දළ ලාභ ආන්තිකය කර්මාන්තශාලා පිරිවැයෙන් 25% කි. මෙම නිෂ්පාදිතය සඳහා මසකට රු. 3,000 ක පුරස්කාරයක් ගෙවිය යුතු ය.

2008 පෙබරවාරි මාසය අග දී නොනිමි වැඩ තොග පිරිවැය මාසය ආරම්භයට වඩා රු. 76,400 ක් වැඩි ය. නිපදවීමට ලක් කළ නිෂ්පාදන උපකරණ, පෙබරවාරි 25 වන දින නිමකර තිබිණ.

**පිළියෙල කරන්න.**

(i) තොග ලෙජර් පාලන ගිණුම **(ලකුණු 04)**

(ii) නොනිමි වැඩ පාලන ගිණුම **(ලකුණු 04)**

(iii) නිමි භාණ්ඩ පාලන ගිණුම **(ලකුණු 04)**

(iv) නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය පාලන ගිණුම **(ලකුණු 04)**

(v) උපකරණ ගිණුම **(ලකුණු 04)**

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03** *(ලකුණු 20)*

STW ආයතනය ''සම්මත'' හා ''විශේෂිත'' යනුවෙන් භාණ්ඩ දෙවර්ගයක් නිපදවයි. ''සම්මත'' භාණ්ඩය ඒකකයක් රු. 36 බැගින් විකුණන අතර, ''විශේෂිත'' භාණ්ඩය ඒකකයක් රු. 40 බැගින් විකුණයි. පහත දැක්වෙන්නේ භාණ්ඩවල වර්තමාන ඍජු ද්‍රව්‍ය පිරිවැය හා ඍජු ශ්‍රම පිරිවැයයි.

| | | ''සම්මත'' | | ''විශේෂිත'' |
|---|---|---|---|---|
| මාසික නිෂ්පාදනය ඒකක | | 10,000 | | 2,500 |
| ඍජු ද්‍රව්‍ය | | රු. 20.00 | | රු. 17.50 |
| ඍජු ශ්‍රමය | රු. 12 x පැය 0.5 | රු. 6.00 | රු. 12 x පැය 0.25 | රු. 3.00 |

පොදුකාර්ය පිරිවැය නිෂ්පාදනවලට අන්තර්ග්‍රහණය කෙරෙන්නේ ඍජු ශ්‍රම පිරිවැය අනුව ය. ඇස්තමේන්තුගත මුළු පොදුකාර්ය පිරිවැය රු. 101,250 කි. ඍජු ශ්‍රම පිරිවැය පැය 5,625 කි.

ආයතනයේ විවිධ ක්‍රියාකාරකම් මට්ටම් හා එයට අදාළ පිරිවැය තොරතුරු පහත දැක්වේ.

| ක්‍රියාකාරී පිරිවැය කාණ්ඩය | ක්‍රියාකාරී මිණුම | භාණ්ඩ සඳහා අපේක්ෂිත ක්‍රියාකාරී මට්ටම | | | ඇස්තමේන්තුගත පොදුකාර්ය පිරිවැය |
|---|---|---|---|---|---|
| | | ''සම්මත'' | ''විශේෂිත'' | එකතුව | |
| ගැණුම් | ඇණවුම් සංඛ්‍යාව | 82 | 118 | 200 | 12,000 |
| ද්‍රව්‍ය මෙහෙයවීම | ලදුපත් සංඛ්‍යාව | 116 | 184 | 300 | 15,000 |
| නිෂ්පාදන ඇණවුම් හා සංවිධානය | සංවිධාන පැය | 50 | 200 | 250 | 20,250 |
| පරීක්ෂණය | පරීක්ෂණ පැය | 300 | 500 | 800 | 16,000 |
| රාමුව එකලස් කිරීම | එකලස් පැය | 800 | 800 | 1,600 | 8,000 |
| යන්ත්‍ර සම්බන්ධ | යන්ත්‍ර පැය | 5,000 | 5,000 | 10,000 | 30,000 |
| | | | | | **101,250** |

අවශ්‍යවන්නේ:

(i) පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කිරීමේ සාම්ප්‍රදායික ඍජු ශ්‍රම පැය ක්‍රමය අනුව නිෂ්පාදනවල මුළු පිරිවැය හා ඒකකයකට දළ ලාභය ගණනය කරන්න. (ලකුණු 06)

(ii) භාණ්ඩවල අපේක්ෂිත ක්‍රියාකාරී මට්ටම් අනුව පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කිරීමේ පදනම අනුව මුළු පිරිවැය හා භාණ්ඩ ඒකකයක දළ ලාභය ගණනය කරන්න. (ලකුණු 10)

(iii) පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධයෙන් කළමනාකාරීත්වයට නිර්දේශ ඉදිරිපත් කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 20)

**<u>ප්‍රශ්න අංක 04</u>** *<u>(ලකුණු 20)</u>*

මිලාන් නිෂ්පාදන සමාගම වැඩ පිරිවැය ක්‍රමය අනුගමනය කරයි. වර්ෂය මුල සහ අග තොග ශේෂ පහත දැක්වේ.

| | **2007 ජුනි 01 දිනට ආරම්භක ශේෂය** | **2008 මැයි 31 දිනට අවසන් ශේෂය** |
|---|---|---|
| | රු. | රු. |
| අමුද්‍රව්‍ය | 14,000 | 22,000 |
| නොනිමි වැඩ | 27,000 | 9,000 |
| නිමි භාණ්ඩ | 62,000 | 77,000 |

පූර්ව නිගමණිත පොදුකාර්ය පිරිවැය ප්‍රමාණයක් යාන්ත්‍රික පැය ක්‍රමය යටතේ සමාගම විසින් වැඩ සඳහා යොදා ගනී. නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය වශයෙන් රු. 231,000 ක් දැරිය හැකි බවත්, යාන්ත්‍රික පැය 33,000 වැඩ කරන බවත් සමාගම විසින් වසර මුල දී ඇස්තමේන්තු කර ඇත.

පහත සඳහන් ගනුදෙනු වර්ෂය සඳහා වාර්තාගත කොට ඇත.

- මිලට ගත් අමුද්‍රව්‍ය රු. 315,000 කි.
- නිෂ්පාදනය සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය රු. 307,000 ක් වේ යැයි ගණන් බලා ඇත. (සෘජු රු. 281,000 හා වක්‍ර 26,000)
- පහත සඳහන් සේවක වියදම් දරා ඇත.
  - සෘජු ශ්‍රමය රු. 377,000
  - වක්‍ර ශ්‍රමය රු. 96,000
  - පරිපාලන වේතන රු. 172,000
- විකුණුම් වියදම් රු. 147,00 කි.
- කර්මාන්තශාලා පහසුකම් ගාස්තු රු. 10,000 කි.
- වර්ෂයේ ක්ෂයවීම් රු. 127,000 කි. මින් රු. 120,000 ක් කර්මාන්තශාලාව සඳහා ද, රු. 7,000 ක් විකුණුම් හා පරිපාලන කාර්යයන් සඳහා ද වේ.
- නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය වැඩ සඳහා යොදාගන්නේ යාන්ත්‍රික පැය අනුව ය. වර්ෂයේ ක්‍රියාකාරී මට්ටම යාන්ත්‍රික පැය 34,000 කි.
- වර්ෂයේ විකුණුම් රු. 1,253,000 කි.

**අවශ්‍ය වන්නේ:**

(i) නිපදවන ලද භාණ්ඩවල පිරිවැය දැක්වීමට සටහනක් පිළියෙල කරන්න. **(ලකුණු 09)**

(ii) පොදුකාර්ය පිරිවැය අධික වශයෙන් හෝ ඌණ වශයෙන් යොදාගෙන ඇත් ද? කොපමණ ප්‍රමාණයකින් ද? **(ලකුණු 02)**

(iii) වර්ෂයේ ආදායම් ප්‍රකාශනය සුදුසු ආකෘතියකට පිළියෙල කරන්න. **(ලකුණු 09)**

**(මුළු ලකුණු 20)**

**<u>ප්‍රශ්න අංක 05</u>** *<u>(ලකුණු 20)</u>*

''රෝ'' නිෂ්පාදකයින් T ෂර්ට්ස් නිපදවා ඒවා පාරිභෝගිකයින්ගේ සිත්ගන්නා විලාසිතා අනුව අලංකාර කොට සිල්ලර වශයෙන් අලෙවි කිරීම සඳහා පරිශ්‍රය තුළ තබයි. සමාගම දරණ විවිධ වියදම් පහත දැක්වෙන ආකාරයට ලැයිස්තුගත කොට ඇත.

එක් එක් වියදම් සඳහා සුදුසු පහත දැක්වෙන කුමන පිරිවැය වර්ගීකරණය දැයි දක්වන්න. එක සමාන වියදම් අයිතමයකට එකට වඩා වැඩි පිරිවැය වර්ගීකරණ අඩංගු විය හැකි ය.

**පිරිවැය වර්ගීකරණයඃ**

(a) විචල්‍ය
(b) ස්ථාවර
(c) කාලච්ඡේද
(d) නිෂ්පාදිත
(e) පරිපාලන
(f) විකුණුම්
(g) නිෂ්පාදන
(h) පර්යේෂණ හා සංවර්ධන
(i) ඍජු ද්‍රව්‍ය
(j) ඍජු ශ්‍රමය
(k) නිෂ්පාදන පොදුකාර්ය

**පිරිවැය අයිතමයන්ඃ**

i. T ෂර්ට්ස් සඳහා යොදාගනු ලබන රෙදි පිරිවැය
ii. T ෂර්ට්ස් සඳහා වැටුප්
iii. T ෂර්ට්ස් අලෙවිහල ඉදිරිපිට තබා ඇති අලුත් පුවරුවේ පිරිවැය
iv. මහන යන්ත්‍ර අලුත්වැඩියා කිරීම වෙනුවෙන් සේවකයෙකුට ගෙවූ වැටුප්
v. මැසීමේ කටයුතු සඳහා වැය කළ විදුලි ගාස්තු
vi. T ෂර්ට්ස් සැලසුම්කරුවන්ට හා පින්තාරුකරුවන්ට ගෙවූ වැටුප්
vii. විකුණුම් සේවක වැටුප්
viii. මහන යන්ත්‍ර ක්ෂයවීම්
ix. දෛනික දේශීය මාධ්‍යවල පළවූ ප්‍රචාරණ දැන්වීම් වියදම්
x. අලුත් රෙදි වර්ග, තීන්ත වර්ග, T ෂර්ට්ස් පරීක්ෂණ කිරීම සඳහා සැලසුම්කරුවන්ට ගෙවූ වැටුප්

**(මුළු ලකුණු 20)**

***ප්‍රශ්න පත්‍රය අවසානයි***